# 1.9 දේශීය ජන යාතු කර්මය විමසීමට මහා සමුප්‍රදායේ මිණුම් දඬු යෝග්‍යද?

ඉන්දික ෆර්ඩිනැන්ඩු
නාට්‍ය හා රංග කලා අධ්‍යයන අංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07.

## ABSTRACT

මහා සම්ප්‍රදායන්හි දක්වෙන සමාරෝපය, සංවාද භාවිතය, රංග භාණ්ඩ හා වේෂ භූෂණාදිය භාවිතය වැනි නාට්‍යමය ලක්ෂණ හා අනුකූලතාව දක්වන ප්‍රාසාංගික නිරූපනයන් පමණක් උපුටා දක්වමින් දේශීය යාතු කර්මයේ රංග කලාත්මක අගය තක්සේරු කිරීමට මහැදුරු සරත්චන්ද්‍රයන් ප්‍රමුඛ පර්යේෂකයන් බහුතරය පෙළඹී තිබේ.

එනම්, දේශීය ජන යාතු කර්මයෙහි රංග කලාත්මක අගය තක්සේරු කරන ශාස්ත්‍රීය පර්යේෂණයන්හි දී මෙතෙක් සිදුවූයේ එය මහා සම්ප්‍රදායේ සම්භාවිත රංග කලා මූලධර්ම හා මිණුම් දඬුවලට (ඇරිස්ටෝටල් මූලික බටහිර ධාරණාවේ හෝ භරතමුනි, ප්‍රමුඛ පෙරදිග ධාරණාවේ හෝ) සාපේක්ෂව කොතරම් නාට්‍යානුරූපීදැයි විමසීමකි. මෙහෙයින් දේශීය යාතු කර්මයේ ප්‍රශස්ත රංග කලාත්මක අගයකින් යුතු කොටස ලෙස මූලිකව හුවා දක්වෙන්නේ ඒවායේ එන නාට්‍යමය පෙළපාලි වේ.

සම්මත මහා සම්ප්‍රදායේ මූලධර්ම මත පදනම් වෙමින් දේශීය ජන යාතු කර්මය තක්සේරු කිරීම අසාධාරණ මෙන්ම නොමඟ යන සුළු, බරපතල වැරදි සහගත එළඹුමක් බව මාගේ හැගීමයි. සිංහල ජන සංස්කෘතියේ මූලයන් මඟින්, එහි සමාජ - සංස්කෘතික, ආගමික මෙන්ම දේශපාලනික අවශ්‍යතා පූරණය කරනු වස් උද්භවය ලද දේශය යාතු කර්මය, ඊට හාත්පසින් වෙනස් සහ අන්‍යතර වූ සංස්කෘතික, සම්ප්‍රදායික අවශ්‍යතා සහ අරමුණු විසින් බිහි කරන ලද රංග කලාවක් ඇසුරේ බිහි වූ මූලධර්ම හා න්‍යායන් මඟින් විග්‍රහ කළ නොහැකිය.

පූර්ව නිශ්චිත රංග කලා ආකෘතියක් සමඟ යාතු කර්මය දක්වන සමාන්තර සාම්‍යය සෙවීමට ගියහොත්, එකී ව්‍යායාමය විසින් අනිච්ඡානුගවම, පෙර කී පූර්ව සම්භාව්‍ය නාට්‍ය ආකෘතියට අධිපතිත්වය ලබාදී (පශ්චාත් යටත් විජිත මානසිකත්වයේ අවිඥානක අනුග්‍රහයද නිසා), යාතු කර්මයේ පවතින ඊට ඌනනය කළ හැකි ක්‍ෂුද්‍ර ලක්ෂණ පමණක් හුවා දක්වා සෙසු බහුතරය පර්යේෂකයාගේ අවධානයෙන් නෙරපා හරියි. එකල්හි සමස්තයේ විභවය විමර්ශනය කිරීමෙන් පර්යේෂකයා වියුක්ත කොට, සොයා ගත් ක්‍ෂුද්‍ර අනුකූලතා ලක්ෂණ වලට සරල ඇගයීමක් ලබාදී පර්යේෂණය හමාර කෙරේ.

"කලා කෘතියක් විචාරය කිරීමට හෝ විශ්ලේෂණය කිරීමට මිනුම් දඬු සොයාගත යුත්තේ එකී කෘතිය තුළින්මය". යන විශ්ව සම්භාවිත අදහස දේශීය යාතු කර්මය සම්බන්ධයෙන් ද සාධාරණ මෙන්ම අදාල වෙයි. සිංහල ගැමි යාතු කර්මයේ විපර්යාසක හැකියාව තේරුම් ගැනීමට එය "ප්‍රසංගයක්" සේ සැලකිය යුතු බව (Ritual as a Performance) පැවසෙන මහාචාර්ය බෲස් කප්ෆර්ගේ මතය මෙහිලා වැදගත් වේ.

දේශීය ජන යාතු කර්මයේ අන්තර්ගත විභවයන් වටහා ගැනීමට, එතුළින් ම පැනෙන මිනුම් දඬු ඇසුරු කළ යුතු බවත්, යාතු කර්මය කපා කොටා හුදකලා කැබලිවලට වෙන්කර විශ්ලේෂණය කිරීමට පෙර එකී කොටස් වල අන්තර් සබඳතාව විමසමින් සමස්ත සංස්ලේෂණයකට බඳුන් කළ යුතු බවත්, එය "තනි, ඒකීය රංග කාර්යයක්" ලෙස සැලකිය යුතු බවත් මා යෝජනා කරන්නේ එසේ විමසීමේදී අප මෙතෙක් නොදුටු, නොසොයා ගත් බොහෝ දෑ එතුළ අපට හමුවන බැවිනි. සාම්ප්‍රදායික විමර්ශනයන්ගෙන් ඔබ්බට ගිය වඩා නූතන එළඹුමක් දේශීය යාතු කර්මය විෂයෙහි අවශ්‍ය වන්නේ එහි අන්තර්ගත සැබෑ විභවයන් තවමත් අප සොයාගෙන නොමැති බැවිනි.